සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය | අ.පො.ස.(සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 47 S |

**සිංහල සාහිත්‍ය රසාස්වාදය I,II,III** **කාලය පැය තුනයි**

සැලකිය යුතුයිඃ-
I කොටසෙහි 1,2 ප්‍රශ්නවලටත් II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත් III කොටසෙහි 4, 5, 6, 7, ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකකටත් උත්තර සපයන්න.

## I කොටස

01. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා අතුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "මේ ඇත්හළ කොල්ලෝ නම් ඉතා චපලයෝ ය. නුඹ වහන්සේට උරණවන්නෝ ය."

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙහි නුඹ වහන්සේ යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද?

(ii) " දරුපෙම් මුණුබුරුපෙම් ඇත්තේ මට මතු නොවන්නේ වේ ද? කාටත් සරි ය."

(අ) මෙහි මට යන පදයෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද?
(ආ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතිය ලියවුණු යුගය කුමක් ද?

(iii) " මට පේන්නේ උන් කතාවෙලා උඹේ කරත්තේ හැපෙනවා"

(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කරන්නේ කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කතාව රචනා කළේ කවුද?

(iv) මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙකු මෙදියත උපදනේ නැත
වෙසෙස් සිනිඳු මුවරද බර **සහස් පත**
**කොරොස් නළින්** යුතුවෙයි කටු පෙළිනි යුත

(අ) මෙහි මුල් කවි පද දෙකේ අදහස ලියන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(v) පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙස ද කියා කළගුණ සැලකිය යුත්තේ
දුන් සත පනහවත් ඔහු නැත පිළි ගත්තේ

(අ) මෙම කවිය ඇතුළත් පැදි පෙළේ රචකයා කවුද?
(ආ) "දුන් සත පනහවත් ඔහු නැත පිළි ගත්තේ"යන්නෙන් මතු කෙරෙන අදහස කුමක් ද?

(ලකුණු 4 x 5 = 20)

02. පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නගියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට
වැටහෙයි නොවැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය මත
උගතිම් කිම ද මිනිසා සතු දෙ නෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලම් ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දී එකට හමු වන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවෙකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

i. මෙම පද්‍ය පන්තියේ තේමාව කුමක් ද?

ii. කවියා යොදා ගෙන ඇති ආකෘතිය එම අත්දැකීම රසවත් ව ඉදිරිපත් කිරීම සඳහා කොතෙක් දුරට උචිත වන්නේ ද?

iii. කවියා තම අත්දැකීම් ප්‍රබල ව ඉදිරිපත් කිරීමට යොදාගත් යෙදුම් දෙකක් නම් කරන්න.

iv. උතුර හා දකුණ අතර වෙනසක් නොමැති බව ප්‍රකාශ කෙරෙන යෙදුම් දෙකක් පද්‍ය පන්තියෙන් උපුටා දක්වන්න.

v. කවියා යොදාගත් භාෂාව රස නිෂ්පත්තිය සඳහා කොතෙක් දුරට ගැලපේ ද? (මුළු ලකුණු 25යි)

## II කොටස

03. පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස් දෙකින් එක් කොටසකට පමණක් උත්තර සපයන්න.

එකල බුදුහු තිබී බලවත් වන ලෙඩක් බෙහෙදක් දී සන්සිඳුවන කලක් මෙන් ඔබගේ එබඳු ආනුභාවයක් නැතත් තමන් වහන්සේගේ ආනුභාවයෙන් අත අල්වා ගෙන තව්තිසා දෙව්ලොවට වඩනා සේක් අතුරුමඟ නවදැලි සේනක් මවාලා ඒ සේනේ දා ගිය කණුවෙක දා වක ගැසී ගිය වැඳිරිමැල්ලක මවාලා තව්තිසා දෙව් ලොවට වැඩ සක්දෙව්ඳුහුගේ පන් සියයක් පමණ දෙවඟනන් පැලා "කුමක් ද නන්දයෙහි, රුවින් වූ කලී මේ දෙවඟනෝ යහපත්තු ද නොහොත් දනවු කලණ බිසවු යහපත්තු දැ" යි විචාළ සේක.

"ස්වාමීණී, කුමක් වදාරන සේක් ද මේ දෙවඟනන් දුටු කලට ඒ දනවුකලණ බිසවු නම් අතුරුමඟ නවදැලි සේනේ අප දුටු දා වක ගැසී ගිය වැඳිරිමැල්ලක් වටිත් - දැ" යි කී සේක. ඒ අසා බුදුහු " එසේ වී නම් නන්දයෙනි, ශාසනාභිරතිය ඇති ව සිල් රක්‍ෂා කළේ නම් කෙලෙසුන් ගෙවා ගන්නට නුවූවොත් දෙව්ලොව ඉපිද දෙවඟනන් ලබන නියාවට මම ඇපයෙමි" යි වදාළ සේක. ඒ අසා නන්ද තෙරුන් වහන්සේ "එසේ වී නම් දෙවඟනන් ලබන නියාවට මෙ තරම් ඇපත් ඇති බැවින් බඹසර හැසිරෙමි" යි කී සේක. මෙලෙසින් සස්නෙහි ඇලුම් ඇති කරවා හැදහිලි නැති කෙනෙකුන් ප්‍රසිද්ධ ස්ථානයට ගෙන ගොස් තරය කරවා රුවී දෙය කරවා ගන්නා සේ සිල් රක්‍ෂා කිරීමට දෙව්ලොවට ගෙන ගොසින් තරය කරවා ගෙන නන්ද තෙරුන් වහන්සේ හැර ගෙන දෙව්ලොව වැඩ උන් වහන්සේට ඇප වූ නියාව නොහඟවන්නට කරන්නාක් මෙන් දෙව්ලොව දී අතුරුදහන් ව...

i. මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට බුදුන් වහන්සේ නන්ද තෙරුන් කැටුව දෙව්ලොවට වැඩම කළේ ඇයි? (ලකුණු 05යි)

ii. බුදුන් වහන්සේ නන්ද තෙරුන්ගෙන් විමසූ පැනය කුමක් ද? (ලකුණු 05යි)

iii. මෙම පාඨයට අනුව බුදුන් වහන්සේ නන්ද තෙරුන් වහන්සේට ඇප වූයේ කුමක් ද? (ලකුණු 05යි)

iv. දෙව් ලොවින් අතුරුදහන් වීමට පෙර බුදුන් වහන්සේ ක්‍රියා කළ අයුරු කතුවරයා විස්තර කර ඇත්තේ කෙසේ ද? (ලකුණු 10යි)

**නැතහොත්.**

ගොඩේ කන්ද මූකලාන කම්පා කරමින්නේ
රූස්සයෙකි රැ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙ ම පන් පැදුරට උණු කඳුළක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයෙකු වාගේ කන්ද නැඟී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරොව, කියත කලුවරේ ම පණ ආවා ලෙසිනේ
මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

i. වන විනාශය වේගයෙන් සිදුවෙන බව කියවෙන නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 05යි)

ii. වන විනාශයට එරෙහි ව නීතිය සාධාරණ ව ඉටුනොවන බව හැඟවෙන අවස්ථා දෙකක් පැදි පෙළෙන් උපුටා දක්වන්න. (ලකුණු 05යි)

iii. කවි පන්තිය සාර්ථක කර ගැනීමට කවියා යොදාගත් භාෂා උපක්‍රම කෙටියෙන් විස්තර කරන්න.(ලකුණු 05යි)

iv. මිනිස් ක්‍රියාකාරකම් නිසා විනාශ වන ස්වභාව ධර්මය කෙරෙහි කවියා තුළ ඇති වූ සංවේදී හැඟීම් අපූර්වත්වයෙන් නිර්මාණය කර ඇති අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(මුළු ලකුණු 25යි)

## III කොටස

- මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.
- (එක් උත්තරයක් වචන 150ක් වත් තිබිය යුතුය.)

04. මිනිසා තුළ ඇති ආත්මාර්ථකාමී හැසිරීම් හා විශ්වාසයන් දැඩි හාස්‍යයට හා උපහාසයට ලක් කර ඇති අයුරු ඇත් ගාලේ දරු පෙම පද්‍ය පන්තිය ඇසුරෙන් නිදසුන් තුනක්වත් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

05. වෙසක් පහන කෙටිකතාව තුළින් ළමා සිතිවිලි හා ළමා ක්‍රියාකාරකම් සියුම් නිරීක්ෂණයට ලක් කර ඇත. නිදසුන් තුනක්වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

06. කතා පුවත රසවත් ව ඉදිරිපත් කිරීමට ජාතක කතා කරුවා භාෂා භාවිතයේ දී දැක් වූ සමත්කම කුස ජාතකයෙන් නිදසුන් තුනක්වත් ඇසුරින් පෙන්වන්න. (ලකුණු 15යි)

07. තුංමංහන්දිය නවකතාවේ සාර්ථකත්වය කෙරෙහි එහි චරිත නිරූපණය කෙතෙක් දුරට ඉවහල් වූයේ දැයි ඔබට අභිමත චරිත දෙකක් ඇසුරින් නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 15යි)